සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

81 | S | I

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :................................ කෘෂි හා ආහාර තාක්ෂණය - I කාලය: පැය 01යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය යෝජනා ක්‍රමය වූයේ ගල්ඔය ගංගා නිම්න සංවර්ධන ව්‍යාපාරයයි. මේ යටතේ ඉදි කරන ලද ජලාශය වනුයේ,
1. උඩවලව ජලාශය
2. රන්දෙනිගල ජලාශය
3. සේනානායක සමුද්‍රය
4. ඉඟිනිමිටිය ජලාශය

(2) පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලියෙන් හඳුන්වන ලද රට වනුයේ,
1. ශ්‍රී ලංකාව
2. චීනය
3. ඉන්දියාව
4. ඉන්දුනීසියාව

(3) කෘෂි කර්මයට අයත් වන ප්‍රධාන අංග වන්නේ, මින් කවරක් ද?
1. සත්ත්ව පාලනය සහ ධීවර කර්මාන්තය
2. බෝග වගාව සහ සත්ත්ව පාලනය
3. ධීවර කර්මාන්තය සහ වන වගාව
4. වාරි කර්මාන්තය හා වන වගාව

(4) වර්ෂාපතනය පදනම් කරගෙන ශ්‍රී ලංකාව වියළි අතරමැදි සහ තෙත් වශයෙන් ප්‍රධාන කලාප තුනකට බෙදිය හැකිය. මෙයින් වියළි කලාපයට වැඩිම වාර්ෂාපතනයක් ලැබෙන මාස වනුයේ,
1. නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි
2. පෙබරවාරි, මාර්තු, අප්‍රේල්
3. මැයි, ජුනි, ජූලි
4. අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර්

(5) පාසල් ගෙවත්තේ සවිකර ඇති සුළං දිශා දර්ශකයක ඊතලය කරකැවී ඊ හිස ඊසාන දිශාවට යොමුවන අවස්ථාවක සුළං හමන්නේ,
1. ඊසාන සිට නිරිත දෙසට ය.
2. නිරිත සිට ඊසාන දෙසට ය.
3. වයඹ සිට ගිනිකොන දෙසට ය.
4. ගිනිකොන සිට වයඹ දෙසට ය.

(6) අවුරුද්දේ කුමන කාලයක වගා කළත් නියම වයසේදී ම පුෂ්ප හට ගැනීම සිදුවන බෝග හැඳින්වෙන නාමය වනුයේ,
1. ප්‍රභා අවධි සංවේදී බෝග
2. දිගු දින බෝග
3. කෙටි දින බෝග
4. දින උදාසීන බෝග

(7) සිසුන් පිරිසක් විසින් පාසල් ගෙවත්තේ වර්ෂාමානයක් නිවැරදි ව ස්ථානගත කර තිබූ අතර ගුරුතුමා විසින් එහි දෝෂයක් පෙන්වා දෙන ලදී. එම දෝෂය විය හැක්කේ,
1. සමතලා තණ බිමක පිහිටුවා තිබීම.
2. එළිමහන් ස්ථානයක පිහිටුවා තිබීම.
3. ආසන්නතම ගොඩනැගිල්ලේ උසට සමාන දුරින් පිහිටුවා තිබීම ය.
4. බිම සිට 30cm ක් උසින් පුනීල කට සිටින සේ පිහිටුවා තිබීම ය.

(8) බෝග වගාවන්ට සූර්යාලෝකය විවිධාකාර ව බලපායි. සූර්යාලෝකය පවතින කාලසීමාව ප්‍රධාන වශයෙන් බලපාන්නේ,
1. ශාකවල පත්‍ර පතනයට ය.
2. ශාකවල ශ්වසනයට ය.
3. ශාකවල පුෂ්ප හට ගැනීමට ය.
4. ශාකවල මුල් වර්ධනයට ය.

(9) ශීත දේශගුණයක් පවතින උඩරට ප්‍රදේශයේ පමණක් නොව උෂ්ණ දේශගුණයක් පවතින යාපනයේ ද අර්තාපල් වගා කර සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකිය. එම සාර්ථකත්වයට හේතුවන්නේ,
1. දහවල් ශීත දේශගුණය හා උණුසුම් රාත්‍රියයි.
2. අධික වර්ෂාපතනය හා අධික ආර්ද්‍රතාවය
3. උණුසුම් දහවල් කාලය හා ශීත රාත්‍රී කාලයයි.
4. උණුසුම් රාත්‍රිය හා උණුසුම් දහවල් කාලය

(10) ආග්නේය හා අවසාදිත පාෂාණ විවිධ විපර්යාසවලට භාජනය වීමෙන් විපරිත පාෂාණ සෑදේ. එසේ සෑදුණ විපරිත පාෂාණයකි.
1. කිරි ගරුඬ 2. ග්‍රැනයිට් 3. වැලිගල් 4. හුණු ගල්

(11) පාංශු ජීවීන් විශාල මෙහෙයක් සිදු කරනු ලබයි. නමුත් පාංශු ජීවීන් නිසා අහිතකර බලපෑම් ද දක්නට ලැබෙයි. එසේ සිදුවන අහිතකර බලපෑමක් නම්,
1. සමහර ජීවීන් කාබනික ද්‍රව්‍ය වියෝජනය කරයි.
2. සමහර ජීවීන් පස මිශ්‍ර කරයි.
3. සමහර ජීවීන් ශාක වලට රෝග බෝ කරයි.
4. සමහර ජීවීන් ඇලෙන සුළු ද්‍රව්‍ය පිට කිරීම නිසා පාංශු කැටිති ඇතිවීම පහසු කරයි.

(12) ශිෂ්‍යයෙකු ක්ෂේත්‍රයේදී පාංශු වයනය සෙවීම සඳහා තෙත් කළ පස් සාම්පලයක් දෙ අත්ලේ තබා පස රෝල් කර මුදුවක් ලෙස සකසන ලදී. එය රූපයේ දක්වේ.  මේ පස,
1. මැටි පසකි. 2. වැලි පසකි
3. වැලි ලෝම පසකි 4. මැටි ලෝම පසකි.

(13) පාංශු ද්‍රාවණයේ මැටි කලිල හා හියුමස් කලිල අංශු ලෙස කලිල දෙවර්ගයකි. මින් හියුමස් කලිල අංශුවක හැඩය නම්,
1. ගෝලාකාර ය. 2. අක්‍රමවත් හැඩයක් ගනී.
3. ෂඩාස්‍රාකාර ය. 4. චතුරස්‍රාකාර ය.

(14) පාංශු ජලය හා පාංශුවාතය පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.
1. පාංශු ජලය වැඩිවන විට පාංශු වාතය වැඩිවේ.
2. පාංශු ජලය වැඩි වන විට පාංශු වාතය අඩු වේ.
3. පාංශු ජලය වෙනස් වුවද පාංශු වාතය නියමිතව පවතී.
4. පාංශු වාතය වෙනස් වුවද පාංශු ජලය නියමිතව පවතී.

(15) විද්‍යාගාරයේ දී 10 වසර සිසුන් පිරිසක් අහඹු ලෙස ගත් පස් සාම්පලයක PH අගය නිර්ණය කළේ ය. එහි අගය 3.5 ක් විය. ඒ අනුව මෙම පස,
1. ප්‍රබල ආම්ලික ය. 2. උදාසීන ය
3. අධික භාෂ්මික ය. 4. ප්‍රබල භාෂ්මික ය.

(16) වායුගෝලීය වාතයේ සංයුතියට වඩා පාංශු වාතයේ සංයුතියේ වඩා වැඩි වායුව වන්නේ,
1. නයිට්‍රජන් 2. ඔක්සිජන්
3. කාබන්ඩයොක්සයිඩ් 4. මීතේන්

(17) පසට යොදන රසායනික පොහොර පස් අංශු අතර රඳවා තබා ගැනීමට බලපාන රසායනික සංසිද්ධිය වනුයේ,
1. පාංශු ප්‍රතික්‍රියාව 2. කැටායන හුවමාරුව
3. පාංශු හායනය 4. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය

(18) යම් කිසි පසක වැලි, මැටි හා රොන්මඩ ප්‍රමාණය දැන ගැනීමෙන් එම පසේ පහත දක්වෙන කිනම් ලක්ෂණය තීරණය කරගත හැකි ද?
1. පාංශු ව්‍යුහය 2. පාංශු උෂ්ණත්වය 3. පාංශු වයනය 4. පාංශු PH අගය

(19) ශ්‍රී ලංකාවේ ගංගා මිටියාවත් වල ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩය වනුයේ,
1. රතු කහ පොඩ්සොලික් පස 2. දියලු පස
3. රතු දුඹුරු පස 4. අපරිණත දුඹුරු පස

(20) පාංශු කැටායන හුවමාරුව පිළිබඳ අධ්‍යනයේ දී පංශු කලිල පිළිබඳ අවබෝධය වැදගත් ය. මැටි කලිල අංශුවක විෂ්කම්භය වන්නේ,

1. මි. මි. 0.2 ට වඩා විශාල අංශු ය.
2. මි. මී. 0.2 0.02 අතර අංශු ය
3. මි. මි. 0.002 ට වඩා අඩු ඉතා කුඩා අංශු ය.
4. මි. මී. 0.02 සිට 0.002 අතර අංශු ය.

(21) ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන පාංශු ව්‍යුහ ආකාර සංඛ්‍යාව කොපමණ ද?

1. 08 යි.
2. 06 යි.
3. 04 යි.
4. 03 යි.

(22) බෝග වගාවේදී බෝග වර්ගීකරණය භාවිතයට ගැනෙන අවස්ථාවක් ලෙස වඩා ම සුදුසු ප්‍රකාශය මින් කුමක් ද?

1. එකම කුලයේ බෝග ආසන්න භූමිවල වගා කිරීමෙන් පලිබෝධ හානි අඩු වේ.
2. එකම කුලයේ විශේෂ දෙකක් අතර බද්ධය සාර්ථක ය.
3. එකම විශේෂයේ ප්‍රභේද දෙකක් අතර බද්ධය වඩාත් සාර්ථක නොවේ.
4. රනිල බෝග සඳහා ගැඹුරට බිම් සැකසීමක් අවශ්‍ය වේ.

(23) මිරිස් , වී, බණ්ඩක්කා, මුං යන බෝග අයත් වන ශාක කුලය නිවැරදි අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,

1. පොඒසියේ, පැබේසියේ, මැල්වේසියේ, සොලනේසියේ
2. සොලනේසියේ, පොඒසියේ, මැල්වේසියේ, පැබේසියේ
3. සොලනේසියේ, මැල්වේසියේ, පැබේසියේ, පොඒසියේ
4. පොඒසියේ, මැල්වේසියේ, සොලනේසියේ පැබේසියේ

(24) කෝපි, දෙළුම්, කුරුඳු යන ශාක වර්ධන විලාසය අනුව වර්ගීකරණය කළ විට අයත් වන්නේ, පහත කාණ්ඩ අතරින් කවර කාණ්ඩයට ද?

1. ගස්
2. පැළෑටි
3. පඳුරු
4. වැල්

(25) බෝග වගා කිරීම සඳහා බිම් සකස් කිරීම මගින් පහත අරමුණු ඉටු කර ගැනීමට ගොවි මහතෙක් බලාපොරොත්තු වේ.

A - පසේ ජල වහනය දියුණු කර ගැනීම
B - ඒ ඒ බෝගයට උචිත පරිදි හමිය සැකසීම
C - පසේ ඇති ගල් මුල් ආදිය පසෙන් ඉවත් කර ගැනීම
D - පසු අස්වනු හානිය අවම කර ගැනීම

මින් මූලික බිම් සැකසීමට අයත් කාර්යයන් වන්නේ,

1. A, C, D
2. A, B, C
3. B, C, D
4. A, B, C, D

(26) බිම් සකස් කිරීමේ නිවැරදි අනුපිළිවෙල තෝරන්න.

1. පස පෙරළීම, කැට පොඩි කිරීම, පාත්ති සැකසීම, මට්ටම් කිරීම
2. කැට පොඩි කිරීම, පාත්ති සැපයීම, මට්ටම් කිරීම,පස පෙරළීම
3. පස පෙරළීම, පාත්ති සැකසීම, මට්ටම් කිරීම, කාණු සැකසීම
4. පස පෙරළීම, කැට පොඩි කිරීම, මට්ටම් කිරීම, පාත්ති සැකසීම

- **27, 28, 29 ප්‍රශ්න සඳහා මෙම රූප සටහන් යොදා ගන්න.**


(a)


(b)


(c)


(d)

(27) ඉහත රූප සටහන් ඇසුරින් බිම් සැකසීමේදී භාවිත වන බහුකාර්ය උපකරණය වන්නේ,

1. (a)
2. (b)
3. (c)
4. (d)

(28) ගල් මුල් සහිත ඉඩමක බිම් සැකසීමට වඩාත් සුදුසු උපකරණය වන්නේ ඉහත (a), (b), (c), (d) අතරින් කුමක්ද?

1. (a)
2. (b)
3. (c)
4. (d)

(29) පේළියක සිටුවන ලද වී වගාවක පේළි අතර වල් මර්දනය සඳහා භාවිත කළ හැකි වඩා සුදුසු කාර්යක්ෂම උපකරණය වන්නේ.

1. (a)
2. (b)
3. (c)
4. (d)

(30) අතුරු යත් ගෑම යනු
1. බිම් සැකසීම සිදු කර බීජ සිටුවීමට පෙර කරනු ලබන ක්‍රියාකාරකම් ය.
2. පුෂ්පීකරණයට පෙර පසට සිදුකරන ක්‍රියාකාරකම් ය.
3. බෝග සිටුවා අස්වැන්න නෙලන තෙක් පසට සිදු කරන ක්‍රියාකාරකම් ය.
4. බෝග සිටුවන අතර තුර දී පසට සිදු කරන ක්‍රියාකාරකම් ය.

(31) උස් වූ තවාන් පාත්තියක සම්මත පළල හා උස පිළිවෙලින්
1. මීටර් 1 × සෙ. මී. 15
2. මීටර් 2 × සෙ. මී. 30
3. සෙ. මී. 50 × සෙ. මී. 30
4. මීටර් 1 × සෙ. මී. 45

(32) රනිල බෝග, බණ්ඩක්කා වැනි බෝග වල බීජ එක් වරම ක්ෂේත්‍රයේ සිටවනු ලැබේ. මෙයට වඩාම සුදුසු හේතු වන්නේ,
1. එම බෝගවල බීජ විශාල වීමය.
2. එම බෝග පැල උදුරා නැවත සිටුවීමේ දී ලක්වන පීඩාවට ඒවා ඔරොත්තු නොදීම.
3. එම බෝගවල බීජ තරමක් කුඩා බැවින් එක් වරම ක්ෂේත්‍රයේ සිටුවනු ලැබේ.
4. එම බෝග සිටුවීමට ඇති එකම ක්‍රමය කෙළින් ම ක්ෂේත්‍රයේ සිටුවීමයි.

(33) තෙත් කලාපයේ එළවළු බෝග සඳහා සකස් කිරීමට වඩාත් උචිත පාත්ති වර්ගය වන්නේ
1. ගිල් වූ පාත්ති
2. තනි වගා වළවල්
3. වැටි හා කානු
4. උස් පාත්ති

(34) මූල මණ්ඩලයට හානි නොවන පරිදි පැළ ලබා ගැනීම සඳහා ද, තවාන් නොදමන දඹල, වට්ටක්කා, වැනි බීජ වර්ග ද තවාන් කිරීමෙන් පැළ ලබාගත හැකි තවාන් ක්‍රමය වන්නේ,
1. ඩැපොග් තවාන
2. උස් තවාන
3. බඳුන් තවාන
4. නෙරිඩෝකෝ තවාන (කුට්ටි)

(35) තවානට බීජ දැමූ පසු බීජ හොඳින් පැලවීම හා බීජ වල ආරක්ෂාව සඳහා තවාන මතුපිටට දමන වසුන ඉවත් කරනු ලබන්නේ
1. බීජ පැළ ගලවන අවස්ථාවේ දීය.
2. බීජ පැළවලට දින 10 ක් පමණ වන විටදී ය.
3. බීජ පැළ වලට සති 2 ක් පමණ වන විටදී ය.
4. බීජ පැළ පසෙන් මතුවන අවස්ථාවේදී ය.

(36) පාංශු ජීවානුහරණ ක්‍රමයක් නොවන්නේ,
1. සූර්ය තාපය මගිනි
2. උණු ජලය මගිනි
3. අතුරු යත්ගෑම මගිනි
4. රසායනික ක්‍රම මගිනි

(37) පසෙන් ජලය ඉවත්වන ක්‍රමයක් වන්නේ,
1. වාෂ්පීකරණය
2. ප්‍රභාසංස්ලේෂණය
3. ශ්වසනය
4. විසරණය

(38) බෝග වගාවේදී ජල වහනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
1. බිම් සැකසීමේ පහසුව සඳහා පසට ජලය සැපයීමයි.
2. පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව දියුණු කිරීමයි.
3. අතිරික්ත ජලය වගා ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමයි.
4. පාංශු ජලය ප්‍රමාණවත් නොවන විට බෝගවලට ජලය සැපයීමයි.

(39) වී වගාව සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය මින් කුමක් ද?
1. පිටාර ක්‍රමය
2. ඇලි හා වැටි ක්‍රමය
3. තීරු ක්‍රමය
4. බේසම් ක්‍රමය

(40) වියළි කලාපයේ නිවෙස් වල වහළය මතට වැටෙන ජලය එක්රැස් කර ගැනීම සඳහා සුදුසු ඇටවුමක් වන්නේ,
1. වගා ළිඳ
2. වැව්
3. වැසි ජල ටැංකි
4. පොකුණු

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 81 | S | II |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :................................ කෘෂි හා ආහාර තාක්ෂණය - II කාලය: පැය 02යි.

වැදගත් :
- ✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) තිරසර පාසල් සංවර්ධන වැඩසටහන යටතේ පාසල් ගොවිපළක් සැකසීමට ඇතුගල මහා විද්‍යාලයේ සිසු දරුවන් සැලසුම් කරන ලදී. එහිදී ප්‍රදේශයේ භූ විෂමතාව හා පාරිසරික තත්ව යටතේ සුදුසු පරිදි බෝග වගාව සිදු විය යුතු බවට යෝජනා විය. මෙම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය 1800 mm ක් ද භූමිය බෑවුම් විය.

(i) මෙම පාසල අයත් දේශගුණික කලාපය විය හැක්කේ කුමක් ද?

(ii) මෙම ගොවිපල සැකසීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු 02 ක් ලියන්න.

(iii) මෙම වගා භූමියේ සංස්ථාපනය කළ හැකි බෝග කාණ්ඩ 04 ක් දක්වන්න.

(iv) පසට කාබනික පොහොර එකතු කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

(v) සාපෙක්ෂ ආර්ද්‍රතාවයේ හිතකර බලපෑම් දෙකක් ලියන්න.

(vi) ජල සම්පාදනය යන්න අර්ථ දක්වන්න.

(vii) පාංශු මහා ජීවීන් දෙදෙනෙක් නම් කරන්න.

(viii) සාර්ථක බෝග වගාවක් සඳහා පවත්වා ගත යුතු ජල තෙතමන තත්වය හඳුන්වන්නේ කවර නමකින්ද?

(ix) පසේ භෞතික, රසායනික හා ජෛව ලක්ෂණ පිරිහී යාම හඳුන්වනු ලබන නම කුමක් ද?

(x) කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙනයන යෝධ ඇල කා විසින් නිර්මාණය කරන ලද්දක් ද?

(ලකුණු 20)

(2) බෝගයක වර්ධනය හා ප්‍රජනන අවස්ථාවලදී ශාකයක සියලු ම කායික ක්‍රියා සිදුවන්නේ ජානමය හා පාරිසරික සංයුතිය අනුවයි.

(i) බෝගයක සිදුවන කායික ක්‍රියා දෙකක් සඳහන් කරන්න (ල. 02)

(ii) (a) කාලගුණය යන්න අර්ථ දක්වන්න. (ල. 02)

(b) වර්ෂාපතනය මැනීම සඳහා භාවිතා වන ප්‍රධාන වර්ෂාමාන දෙක නම් කරන්න (ල. 02)

(iii) (a) ශ්‍රී ලංකාවේ පළමු අන්තර් මෝසම් වැසි ලැබෙන ප්‍රදේශය හා ලැබෙන කාල සීමාව දක්වන්න.(ල. 02)

(b) යල කන්නයට වී වගාවේදී වැපිරීම. බීජ හෝ පැළ සිටුවීම කරනු ලබන මාසය නම් කරන්න. (ල. 01)

(c) උච්චත්වය මුහුදු මට්ටමේ සිට ඉහළ යන සෑම මීටර් 100 කට උෂ්ණත්වය වෙනස සඳහන් කරන්න.

(ල. 01)

(3) කෘෂි කර්මාන්තයේදී බෝග වගා කරන උපස්ථර හෙවත් වගා මාධ්‍ය වන්නේ පසයි. ඉන් ඉටු කෙරෙන සුවිශේෂී කාර්යයන් කීපයකි.

(i) (a) පසෙහි සංඝටක දෙකක් නම් කරන්න. (ල. 02)

(b) ක්වාට්ස් පාෂාණය තවත් නමකින් හඳුන්වන්න. (ල. 01)

(ii) (a) පාංශු ව්‍යුහය යන්න අර්ථ දක්වන්න. (ල. 02)

(b) බෝග වගාවට හිතකර පාංශු ව්‍යුහය කුමක් ද? (ල. 01)

(c) පසේ රසායනික ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(iii) (a) පසේ PH අගය මැනීම සිදු කරන ක්‍රම දෙකක් ලියන්න (ල. 01)

(b) පාංශු ජල ආකාර 02 ක් නම් කරන්න. (ල. 01)

(4) ගෙවතු වගාවකදී වගා කර ඇති බෝග වර්ග පහත දක්වා ඇත.

(අඹ, වැටකොළු, බටු, මිරිස්, තේක්ක, කිරි අල, පලා වර්ග, බතල, අන්නාසි, බඩ ඉරිඟු)

(i) (a) ඉහත බෝග අතරින් පලතුරු බෝග දෙකක් නම් කරන්න (ල. 02)

(b) මෙම බෝග අතරින් පොඒසියේ හා සොලනේසියේ බෝග එක බැගින් නම් කරන්න (ල. 02)

(ii) (a) වැටකොළු අයත්වන ශාක කුලය නම් කරන්න (ල. 01)

(b) එම කුලයට අයත් වෙනත් බෝග දෙකක් සඳහන් කරන්න. (ල. 01)

(iii) (a) ශාක වර්ගීකරණය ලොවට හඳුන්වා දුන් විද්‍යාඥයා කවුද? (ල. 02)

(b) බෝග වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න. (ල. 02)

(5) බෝග වර්ධනය, වැඩි එලදාව, පාංශු සංරක්ෂණය සඳහා නිවැරදි බිම් සැකසීම වැදගත් වේ.

(i) (a) මූලික බිම් සැකසීම යන්න අර්ථ දක්වන්න (ල. 02)

(b) එහි ප්‍රධාන පියවර දෙකක් ලියන්න. (ල. 02)

(ii) (a) ශාක පසෙන් උදුරා අස්වනු නෙලා ගනු ලබන බෝග සහ කුඩා මූල පද්ධති සහිත බෝග සිටුවීමේදී බහුලව භාවිතා කරන පාත්ති ක්‍රමය කුමක් ද? (ල. 01)

(b) ඒ සඳහා භාවිතා කළ හැකි උපකරණය නම් කරන්න. (ල. 01)

(iii) (a) භාවිතා කරන අවස්ථාව අනුව බිම් සැකසීමේ උපකරණ වර්ගීකරණ වගුවට පහත සඳහන් උපකරණ ඇතුළත් කර දක්වන්න.

ගැමි ලී නගුල, හෝව වර්ග, අත් පෝරුව, රොටවේටරය, උදළු මුල්ලුව, අත් ඉස්කෝප්පය

| ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ | ද්වීතික බිම් සැකසීමේ උපකරණ | අතුරු යත්ගෑමේ උපකරණ |
|---|---|---|
| | | |

(ල. 03)

(b) ක්‍රමවත් බෝග සංස්ථාපන උපකරණ භාවිත කිරීමේ වාසියක් සඳහන් කරන්න. (ල. 01)

(6) 10 ශ්‍රේණියේ කෘෂි විද්‍යාව හදාරණ සිසු පිරිසක් ව්‍යාපෘතියක් ලෙස තවාන් පැල නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ මගින් ප්‍රායෝගික දැනුම මෙන්ම කෘෂි ව්‍යවසායකත්වයට ද යොමු විය හැකි බව විදුහල්පතිතුමාගේ ද අදහස විය.

(i) (a) තවානක් සඳහා සුදුසු ස්ථානයක තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(b) මෙම සිසුන් තෙත් කලාපයට සුදුසු සහ වියළි කලාපයට සුදුසු පරිදි තවාන් දෙවර්ගයක් නිර්මාණය කරන ලදී . එම පාත්ති දෙක කුමක් විය හැකි ද? (ල. 02)

(ii) (a) ගිල්වූ තවාන් පාත්ති සැකසීමේදී විශේෂිත පියවරක් ලෙස පතුල සහ පැති ආවරණය වනසේ සිදුරු කීපයක් සහිත පොලිතිනයක් අතුරා ගනු ලැබේ. මීට හේතුවක් ලියන්න.. (ල. 01)

(b) පරිසර හිතකාමී බඳුන් වර්ග තෝරා ගැනීමට එම සිසුන් අවධානය යොමු කළ අතර ඒ සඳහා යොදාගත් බඳුන් වර්ග 02 ක් ලියන්න. (ල. 02)

(iii) තවාන් මිශ්‍රණයක තෙතමන තත්වය පරීක්ෂා කිරීමට භාවිතා කළ හැකි සරළ පියවර කුමක් ද? එහිදී ඔබට එළඹිය හැකි නිගමනයක් ලියන්න. (ල. 03)

(7) ජලය සීමිත සම්පතක් වන බැවින් එය මතු පරපුර වෙනුවෙන් මනාව කළමනාකරණය කළ යුතු වන අතර අතීතයේ ද ජල කළමනාකරණය කෙරෙහි ඉහළ අවධානයක් තිබූ බවට සාක්ෂි ඇත.

ජල සම්පාදන ක්‍රමයක රූප සටහනක් පහත දැක්වේ.



(i) (a) මෙම රූපයෙන් පෙන්වන ජල සම්පාදන ක්‍රමය නම් කරන්න (ල. 01)

(b) එහි වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න. (ල. 02)

(c) මෙම ක්‍රමයෙන් ජලය සැපයිය හැකි බෝග වර්ග 04 ක් නම් කරන්න (ල. 02)

(ii) (a) ජල වහන ක්‍රම 02 ක් දක්වන්න. (ල. 01)

(b) ජල වහන කාණු රටා පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල.02)

(iii) දුර්වල ජල වහනයක් සහිත පසක දක්නට ලැබෙන බෝග වගාවට අහිතකර ලක්ෂණ දෙකක් ලියන්න.

(ල. 02)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**81 S I II**

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

## කෘෂි හා ආහාර තාක්ෂණය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 3 | 21 | 3 | 31 | 1 |
| 2 | 1 | 12 | 1 | 22 | 2 | 32 | 2 |
| 3 | 2 | 13 | 2 | 23 | 2 | 33 | 4 |
| 4 | 1 | 14 | 2 | 24 | 3 | 34 | 4 |
| 5 | 1 | 15 | 1 | 25 | 2 | 35 | 4 |
| 6 | 4 | 16 | 3 | 26 | 4 | 36 | 3 |
| 7 | 3 | 17 | 2 | 27 | 1 | 37 | 1 |
| 8 | 3 | 18 | 3 | 28 | 3 | 38 | 3 |
| 9 | 3 | 19 | 2 | 29 | 2 | 39 | 1 |
| 10 | 1 | 20 | 3 | 30 | 3 | 40 | 3 |

### II පත්‍රය

(1) (i) අතරමැදි කලාපය
(ii) භූ විෂමතාව, ප්‍රදේශයේ පාරිසරික තත්ව, වර්ෂාපතනය
(iii) එළවළු, පළතුරු, පලා, මාෂ භෝග. වැනි බෝග කාණ්ඩ හතරකට
(iv) * පාංශු ව්‍යුහය දියුණු වීම
* තෙතමනය ආරක්ෂා වීම
* ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩිවීම
* පෝෂක රඳවා ගැනීම වැනි නිවැරදි පිළිතුරු සඳහා
(v) දඬු කැබලි මුල් ඇද්දවීම, පරාගනයට ආදී පිළිතුරු සඳහා
(vi) පාංශු ජලය ප්‍රමාණවත් නොවන විට බෝගයට ජලය සැපයීම
(vii) ගැඩවිළුන්, වේයන්, කුරුමිණියන්, කුහුඹුවන් වැනි ක්ෂුද්‍ර ජීවීන්
(viii) ක්ෂේත්‍ර ජල ධාරිතා තත්වය
(ix) පාංශු හායනය
(x) ධාතුසේන රජතුමා (ල. 2x10 20)

(2) (i) (a) උත්ස්වේදනය, රසෝද්ගමනය, ශ්වසනය, ප්‍රභාසංස්ලේෂණය ජල අවශෝෂණය ආහාර පරිසංක්‍රමණය (ල. 02)
(ii) (a) කෙටි කාලයක් තුළදී වායුගෝලයේ පවතින වෙනස (ල. 02)
(b) සරල වර්ෂාමානය, ස්වයංක්‍රීය වර්ෂාමානය (ල. 02)
(iii) (a) දිවයින පුරා මාර්තු, අප්‍රේල් (ල. 02)
(b) අප්‍රේල් 15 ට ප්‍රථම (අප්‍රේල් මැයි වැනි පිළිතුරක්) (ල. 01)
(c) $0.64^0$ සෙල්සියස් (ල. 01)

(3) (i) (a) පාංශු ඛණිජ, පාංශු ජලය, කාබනික ද්‍රව්‍ය, පාංශු ජීවීන් (ල. 02)
(b) තිරුවානා (ල. 01)
(ii) (a) පස් අංශු සැකසී ඇති ආකාරය (ල. 02)
(b) කැටිති ව්‍යුහය (ල. 01)
(c) පාංශු ප්‍රතික්‍රියාව, කැටායන හුවමාරුව (ල. 02)
(iii) (a) PH මීටරය මගින්
PH කඩදාසි මගින් (ල. 01)
(b) කේශාකර්ෂන ජලය ජලාකර්ෂණ ජලය ගුරුත්වාකර්ෂණ ජලය (ල. 01)

(4) (i) (a) අන්නාසි, අඹ (ල. 02)
(b) බඩ ඉරිඟු, බටු, මිරිස් (ල. 02)
(ii) (a) ක්‍යුකබිටේසියේ කුලය (ල. 01)
(b) කරවිල, පිපිඤ්ඤා වැනි බෝග (ල. 01)
(iii) (a) කැරෝලස් ලිනේයස් (ල. 02)
(b) බිම් සැකසීමේදී, පොහොර යෙදීමේදී යනාදී (ල. 02)

(5) (i) (a) යම්කිසි බෝගයක් භූමියේ සංස්ථාපනය කිරීමට පෙර පස හා සම්බන්ධ ව සිදු කරන සියළුම ක්‍රියාකාරකම් (ල. 02)
(b) ප්‍රාථමික බිම් සැකසීම
ද්විතීයික බිම් සැකසීම (ල. 02)
(ii) (a) වැටි හා කාණු (ල. 01)
(b) රිජරය (ල. 01)
(iii) (a)

| ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ | ද්විතික බිම් සැකසීමේ උපකරණ | අතුරු යත්ගැමේ උපකරණ |
|---|---|---|
| ගැමි ලී නගුල<br>උදළු මුල්ලුව | රොටවේටරය<br>අත් පෝරුව | හෝව වර්ග<br>අත් ස්කොප්පය |

(ල. 03)

(b) ශ්‍රමය අඩුයි
පොහොර යෙදීම, වල් නෙළීම පහසුයි වැනි පිළිතුරක් සඳහා (ල. 01)

(6) (i) (a) අදාල පිළිතුරට (ල. 02)
(b) උස් පාත්ති, ගිල්වූ පාත්ති (ල. 02)
(ii) (a) පාත්තිය තුළ ජලය සංරක්ෂණය
අතිරික්ත ජලය බැස යාම (ල. 01)
(b) පොල්ලෙලි බඳුන්, කෙසෙල් පට්ට බඳුන්, කඩදාසි බඳුන් (ල. 02)
(iii) * තෙත් කරන ලද පස් ස්පල්පයක් අතට ගෙන මිට මොලවා තෙතමන තත්වය පරීක්‍ෂා කිරීම (ල. 02)
* <u>නිගමනය</u> ප්‍රමාණවත් තෙතමනයේදී ගුලියක් සෑදේ නැතිනම් ලිහිල් වී කැඩේ. (ල. 01)

(7) (i) (a) බේසම් ක්‍රමය (ල. 01)
(b) <u>වාසි</u> * ජලය සැපයීමේ වාර ගණන අඩුය
* ජලය අපතේ යාම අඩුය
* වියදම අඩුයි
<u>අවාසි</u> * වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ
* ජල රැඳවීම නිසා පාංශු ව්‍යුහය දුර්වල වේ.
* වැලි පසකට නුසුදුසු ක්‍රමයකි (ල. 02)
(c) අඹ, රඹුටන්, බණ්ඩක්කා, මිදි (ල. 02)
(ii) (a) ජල වහන ක්‍රම 2 කට (ල. 01)
(b) හැඳින්වීම අනුව (ල. 02)
(iii) (a) පාංශු වාතය නොමැතිවීම
* හිතකර පාංශු ජීවීන් නැතිකම
* උපකරණ භාවිතයට අපහසු වීම
* ලවණතාවය වැඩිකම (ල. 02)